" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/01-2020 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2020-06- 08 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්(බ.ප),
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප.),
සභා ලේකම්(බ.ප),
ලේකම්, (පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන/පිරිස් හා පුහුණු/මුල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන ඒකකය),
පරිපාලන නිලධාරි(පාලන),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/ පරිපාලන නිලධාරි,

**<u>කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2020, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 හා 05/2016 බස්නාහිර පළාතට අදාල කර ගැනීම.</u>**

පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/2/19/01/2020 හා 2020.03.20 දිනැති ලිපිය මඟින් මා වෙත දන්වා ඇත. (එම චක්‍රලේඛ පිටපත් මේ සමඟ අමුණා ඇත.)

| අනු අංකය | චක්‍රලේඛ අංකය හා දිනය | කාරණය |
|---|---|---|
| 01. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2020, 2020-02-21 | සියලු බඳවාගැනීම් තාවකාලිකව අත්හිටුවීම |
| 02. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016, 2016-12-29 | රජයේ වාහන නඩත්තු කිරීම |
| 03. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2020, 2020-02-20 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2137/88 හා 2019 අගෝස්තු මස 23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ඇතුළත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම |

02. එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙසත් ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානින්, ආයතන ප්‍රධානින් හා නිලධාරින් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

කේ.එන්. සූරියආරච්චි,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් (බ.ප.) වෙනුවට.

මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMY AND POLICY DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 2484500, 011 2484600, 011 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2449823
වෙබ් අඩවිය / இணைய தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: DMS/Cir/2020
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2020.02.21

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක : 01/2020

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන්,

**<u>සියලු බඳවාගැනීම් තාවකාලිකව අත්හිටුවීම.</u>**

රාජ්‍ය අංශයේ හා අනුබද්ධිත නියෝජිත ආයතනයන්හි ප්‍රාථමික සේවා ශ්‍රේණියේ පවතින සේවා අවශ්‍යතාවයන් ඉහළ ගුණාත්මකභාවයකින් මෙන්ම නිසි පිරිවැය කළමනාකරණයකින් කාර්යක්ෂමව ද, ඵලදායීව ද ඉටුකිරීමේ අපේක්ෂාවෙන්, පුහුණු ශ්‍රමය සැපයීම පෙරදැරි කරගෙන බහුකාර්යය සංවර්ධන කාර්ය සාධක බලකායක් පිහිටුවීමට 2020.01.08 දිනැතිව අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර ඇත.

02. ඒ අනුව සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ඒ යටතේ වන සියලුම ආයතනයන්හි ප්‍රාථමික සේවා ශ්‍රේණියේ ( PL-1, PL-2 සහ PL-3) දැනට පවතින සියලුම පුරප්පාඩු සඳහා බඳවාගැනීම් නැවත දැනුම් දෙන තුරු අත්හිටුවීමට 2020.01.22 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇති අතර එකී තීරණය පරිදි කටයුතු කිරීමට පියවර ගත යුතුය.

03. එසේම සියලුම ආයතනවල 2019.12.31 දිනට එම සේවා ශ්‍රේණියන්හි පවතින පුරප්පාඩු පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් ඇමුණුම I පරිදි අමාත්‍යාංශ ලේකම්වරුන් මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර එකී ආකෘති පත්‍රයෙහි පිටපතක් එක්සෙල් පැතුරුම්පතක (Ms Exel Spreadsheet) සම්පූර්ණ කර <u>vacancies.dms@gmail.com</u> යන විද්‍යුත් තැපැල් ලිපිනයට ද යොමු කිරීමට කටයුතු කළ යුතුය.

04. තවද, "සියලු බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවීම" යන මැයෙන් නිකුත් කළ මගේ අංක DMS/Policy/Recruitments හා 2019.11.20 දිනැති ලිපියේ විධිවිධාන තවදුරටත් නොවෙනස්ව පවතින බව අවධාරණය කරමි.

**එස්.ආර්.ආටිගල**
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :-
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති
5. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව
6. ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව

ඇමුණුම I

| අනු අංකය | ආයතනය | තනතුරු නාමය | වැටුප් කේතය | අනුමත තනතුරු සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

.............................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

.............................................

අමාත්‍යාංශ ලේකම්/පළාත් ප්‍රධාන ලේකම්ගේ අත්සන